සිනමාව සේකර යුද්ධය හා තවත් කතා

ශාන්ත සිරිවර්ධන

රටක ජීවත් වන සිනමා ලෝලීන් සිනමාහලක් කරා ගොස් සැදී පැහැදී කිසියම් චිත්‍රපටයක් නරඹන්නෙ, එහි සිනමා භාෂාය, රූප භාවිතය, කැමරා කෝණ, තාක්ෂණය හෝ රඟපෑමේ ශිල්පීය ක්‍රම පිළිබඳ ගැඹුරු අධ්‍යනයක් හැදෑරීමට නොවේය. සිතේ කාන්සිය මිගහැර ඒකාකාරීත්වයෙන් මිදීමේ කෙටි ක්‍රියා මාර්ගයක් ලෙස හා සිතට යම් වින්දනයක් ලබාදෙමින් සිත සැහැල්ලු කර ගැනීමට රසිකයා බොහෝ කැමැතිය. සිනමාකරුවා විසින් අදාල ශිල්පීය ක්‍රම භාවිතා කර ගනිමින් තම සමාජයට පිරිනමන ලද නිර්මාණයන් හැරවීම රසික ජනතාවට භාර කාර්යයකි. එබැවින් ශාස්ත්‍රීයත්වය අභිත් ඉතා පැසුණු බුද්ධියක් ඇති ශ්‍රී ලාංකිකයෝ තම රසාස්වාදය සඳහා, වේදිකා නිර්මාණ රූපවාහිනිය, ශ්‍රවණමාධ්‍ය හා සිනමාව වැනි දෑ තෝරා බේරාගෙන ජීවායින් වන සමාජීය කාර්යයන් මැනවින් හඳුනාගෙන වෙන් වෙන් වශයෙන් රසවිඳීමට පුරුදුව සිටිති. සිනමා පටයක් නරඹා එය රසවිඳ නිවසට යන රසිකයා හට තමා පෙර දින නැරඹූ සැලොලයිඩ් පටයේ තිබූ දර්ශන සම්හරවිට උඩු සිතින් අමතක වී යාමට පුළුවන. එයට හේතුව නම් තම ජීවනෝපාය ඉදිරියටත් පවත්වාගෙන යෑම සඳහා ගත සිත යන දෙකම වෙහෙසීමට ඇති බැවිනි. සිනමා පටයේ දර්ශන සියල්ල උඩු සිතින් අමතක වී ගියත් නිර්මාණයේ සුවිශේෂ අවස්ථා හෝ රඟ දක්වන ලද නළු නිළියන්ගෙ විශේෂිත රංග නිරූපන, රසිකයකුගෙ යටි හිතේ සදාකාලිකවම තැන්පත් වන අවස්ථා ද ඇත. මෙම රංග නිරූපනය සම්හරක් ජීවිතයේ යම් යම් අවස්ථාවලදී උඩු සිතට මෝදුවී නැවත ස්මරණය කර රසවිඳීමට රසිකයාට පුළුවන. එය පොදු ධර්මතාවකි.

කුඩා කාලයේ සිටම සිනමාපට රසිකයකු වන මා ගැටවරවියේ නැරඹූ සිනමාපටයක එක්තරා චරිතයක් මේ දිනවල උඩු සිතට මෝදු වී ස්මරණය වේ. සිනමා පටය 'වීර පුරන් අප්පු'ය. මතකයේ රැඳුණු චරිතය නම් දේශාභිමානයෙන් ජාතිය අවදි කරවන උත්තරීතර බුද්ධපුත්‍රයාගේ (හාමුදුරුවන්ගෙ) චරිතයයි.

'විනාඩි කීපයකට පමණක් සීමා වූ එම චරිත රංගය ඉතා අපූරුය. එම නිසා මතකයෙ සද රැඳී ඇත. පසු කාලයක මෙම රංගනය ඉදිරිපත් කළ නළුවා කවුරුන්දැයි සොයා බැලීමේදී ඔහු තිස්ස අබේසේකර නම් විය. එතැන් සිට ඔහුගේ කුමන හෝ නිර්මාණයක් කලඑළි දුටුවේද මම එනැනය. එමනිසා මට එද සිට ඔහු මහා සිනමාකරුවකු විය. එහි විවාදයක් නැත.

එහෙත් ප්‍රශ්නයකි. මෑතකදී මේ මහා සිනමාකරුවාගේ නෙළිතුඩට හසුවී අවලාද ලබන අප සමාජයේ ඉහළ තලයේ වැජඹෙන සුවිශේෂ පුද්ගලයන් දෙදෙනෙකි. ඉන් එක් අයකු ශ්‍රී ලංකා නාවික හමුදාවේ රියර් අද්මිරාල් සරත් වීරසේකරය. අනිත් පුද්ගලයා සාහිත්‍යසූරි ආචාර්ය ගුණදාස අමරසේකරය. මා විසින් නම් කරන ලද මහා සිනමාකරුවාත්, සාහිත්‍යසූරි ආචාර්යවරයාත්, රියර් අද්මිරාල්වරයාත් යන තිදෙනාගේම පෙළපත් නාමය අවසන් වන්නේ සේකර නමිනි. එමනිසා මෙතැන් සිට මම සේකර යුද්ධයට අවතීර්ණ වෙමි.

ගුණදාස අමරසේකරයන් සමඟ මහා සිනමාකරුවා අරඹා ඇති උගත්කම පිළිබිඹු කිරීමේ උගත් යුද්ධයට හේතුපාඨ ලිවීමට මා ඔවුන් දෙදෙනා තරම් උගතෙකු නොවන බව කිවයුතුය. එහෙත් විහිළුවට මෙන් මෙසේ ලියමි. අපේ මහා සිනමාකරුවා සිනමාව හා සබැඳි පොත්පත් පරිශීලනය කිරීමෙන් ලබා ගත් අත්දැකීම් හා විදේශීය කලාකරුවන් හා නිර්මාණකරුවන්ගේ නිර්මාණ හා තොරතුරු පිළිබඳ දත්ත සමුදායක් අතැතිව ගුණදාස අමරසේකරයන් සමඟ යුද්ධ ප්‍රකාශ කරනවා විය හැක. ඒ බව ඔහුගේ ලිපි මගින් මනාව පිළිබිඹු වේ.

එහෙත් රියර් අද්මිරාල්වරයා සමඟ අරඹා ඇති සංවාද යුද්ධය සඳහා මහා සිනමා කරුවාට දත්ත හෝ රැස් කරගත් කරුණු හෝ උගත්කමක් නැති බව පෙනේ. මේ රටේ ඒකීයභාවය, ස්වෛරී භාවය, භෞමික-අඛණ්ඩතාවය, ආරක්ෂාකර ගැනීමේ අද්විතීය සටනේ පුරා අවුරුදු 22 ක් රියර් අද්මිරාල්වරයා සමඟ එකතුව සතුරන් සමඟ යුදපිටියේ යුද වැද දනට විශ්‍රාමව සිටින මා හට නිදහස් මනසකින් යුතුව මහා සිනමාකරුවා ඇමතිය හැක. ප්‍රථමයෙන් කිවයුතු කරුණකි, අබේ සේකර මහත්මයාත්, ඔබ ඇතුළු සමස්ත ශ්‍රී ලංකාවාසී ජනතාවට නිදහසේ තම කොට්ටයට හිස තබා නින්දට යාමට හැකි පරිසරයක් සියල්ලන්ටම ලබාදී ඇත්තේ ඔබ අවලාද කරන රියර් අද්මිරාල්වරයා ඇතුළු ත්‍රිවිධ හමුදාවේ මුර දෙවියන් නිසා බව සිතා ගත යුතුය. දිවා රෑ නොනිද කුසට හරි ආහාරයක් නොමැතිව ඔවුන් විසින් දේශය ආරක්ෂා නොකරන්නේ නම් ඔබලාට සිනමා නිර්මාණ කිරීමට තබා තම හිසත් කඳෙන් වෙන් කර දමීමට කොටියා පසුබට නොවෙනු ඇත. එම නිසා ප්‍රථමයෙන් තම දේශයේ හමුදාවට ගෞරව කිරීමට ඉගෙන ගන්නැයි ඉල්ලා සිටිමි.

තිස්ස අබේසේකර මහත්මයා. ඔබ ගැටවරවියේ දී දෝතට ගෙන නැළවූ ඉතා ප්‍රසන්න වූ ඉතා සුරතල් වීරසේකර දරුවා ගැන ඔබ තවමත් සිතා සිටින්නෙ බොළඳ අත දරුවෙක් ලෙස නම් ඔබට වැරදී ඇත. ත්‍රිවිධ හමුදාවේ සිටින ශ්‍රේෂ්ඨ හමුද නායකයෙක් ලෙස මුළු රටේ ජනතාවගෙත්, ත්‍රිවිධ හමුදාවෙත් පැසසුමට ලක්වී ඇති අද්මිරාල්වරයා කුඩා කාලයේ දී මොහොතකට හෝ ඔබ දෑතේ හැලවුණේ නම් අද දින ඔබ ආඩම්බර විය යුතුය. එය වෙන කිසිවක් නිසා නොව එද තම දෑතේ නැලවුන දරුවා අද දේශයේ මුරදෙවියෙක් ලෙස සමාජයට උත්තරීතර මෙහෙයක් කරන්නෙකු නිසාය. එහෙත් එම අද්මිරාල්වරයා සමඟ සංවාදයට එකතු වී ඇත්තේ ඉතා සාධාරණ ඉල්ලීමක් ඉතාමත් අවිහිංසක ලෙස ජනමාධ්‍ය හරහා විසුරුවා හැරීමේ ක්‍රියාව නිසාය. එය වරදක්ද? අද්මිරාල්වරයා ඔහුගේ සාධාරණ ඉදිරිපත් කිරීම ජනමාධ්‍යයට මුද නොහැර රටේ ජනතාවගේ සමාජ රීති අපකීර්තියට පත්කරමින් ජාත්‍යන්තරයට නිර්මාණ ඉදිරිපත් කළ නිර්මාණකරුවන්ගේ ශරීර කුඩුවලට දඬුවම් දුන්නේ නැත. එසේ කිරීමට තරම් අඥාණ බොළඳ ක්‍රියා නොකරන බව අද්මිරාල්වරයාගේ චරිතය හොඳින් දන්නා මා හට ප්‍රකාශ කළ හැක.

මේ රටේ සෑම හමුද බිරිඳක්ම හැම දිනකම බලා සිටිනුයේ තම ස්වාමියා මොහොතක හෝ විරාමයක් ලබා නිවසට එනතුරුය. සති මාස ගණන් දසට නොදුටු තම ස්වාමිපුරුෂයා දකින හමුද බිරිඳගෙ සිත ආදරයෙන් පිරී යන්නීය. එපමණක් නොව ආදරය නැවත නැවුම් ආදරයක් ලෙස අත්විඳින්නීය'. (එය අත්විඳින්නෙ හමුදාභටයන් හා බිරින්දෑවරුන්ය, සිනමා කරුවන්ට එය අදාළ නොවේ.) නැවත නිවාඩු නිමාව වී යුද පිටියට යන තම ස්වාමි පුරුෂයා දෙස බිරිඳ බලා සිටිනුයේ තම දරුවන් ඇකයේ තුරුල් කරගෙන කඳුළු පිරුණු දෑසින්ය. මේ අපගේ හමුද සමාජයේ සාමාන්‍ය තත්ත්වයයි. එහෙත් නිර්මාණකරණයේ යෙදී සිටින සම්හර සිනමාකරුවන් හමුද ක්‍රියාදාමයන් දකින්නෙ ජනමාධ්‍ය හරහා පතුරුවන යුද තොරතුරුය. යුද භටයාගේ පවුල් ජීවිතය හා එහි අභ්‍යන්තරය කලාකරුවා කිසිම දිනක නොදකී. හොඳ හමුද භටයකු නිතැතින්ම හොඳ පුහුණුවක් ලබා ඇත. ඔහු රටට දයට ගෞරවයකි. වාසනාවකි. එහෙත් ඉඳහිට නොමනා ගතිගුණ ඇති හමුද භටයන් ද නැත්තෙ නොවේ. යම් ලෙසකින් එවැන්නෙකු සමඟ කුළුපග වූ කලාකරුවා හමුද ක්ෂේත්‍රය පිළිබඳ කැරුණු කාරණා තම නිර්මාණයට ඇතුලත් කිරීම උදෙසා එවැන්නෙකුගෙන් ලබා ගතහොත් ලබන ප්‍රතිඵලය අයහපත් වේ. එවැනි උපදෙස් දඩම්මා කරගෙන හෝ මෙසේ විය හැකි යැයි මනසේ උපකල්පනය කරගනිමින් කලාකරුවා පෙම් නිර්මාණයක් කර ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කළ පසු එම නිර්මාණය තම රටට සමාජයට හා විශේෂයෙන් හමුදාවට අපකීර්තියක් ගෙන දෙන ලෙස ජාත්‍යන්තර ප්‍රජාවට හැරවීම සඳහා මුද හැරීමෙන් එහි අපකීර්තිය රටටත් විශේෂයෙන් හමුදාවටත් එහි සාමාජිකයන්ගේ පවුල්වලටත් චිත්ත පීඩාවක් ගෙන දෙමින් සජීවම බලපානු ඇත. තම රටේ දුක්දෙමිනස් මැද ජීවත් වන හමුද බිරිද තම කාම ආශාව සිත්හි සඟවාගෙන නැවී නැවී ජීවත්වන්නියක ලෙස හා රහස් තැන ලද කල්හි පිස්සියක මෙන් කාමයේ වරදවා හැසිරෙන්නියක ලෙස සිනමා රූපීව ජාත්‍යන්තරයට වෙළඳහැරීම සිනමා කලාවද? එසේ නැතිනම් සම්මාන හා අධිරාජ්‍යවාදී මුදලට යටවී සංස්කෘතිය විකිණීමේ කලාව දැයි අසන්නට කැමැත්තෙමි.

අබේසේකරයාණෙනි, අද්මිරාල්වරයා තම හඬ අවදි කර ඇත්තේ සමස්ත ශ්‍රී ලාංකිකයන්ගේ සමාජීය හා සංස්කෘතික උරුමය වෙනුවෙනි. එම නිසා ඔබත් අද්මිරාල්වරයාත් දෙපැත්තක රැඳවා ඔබ දෙදෙනා වෙත එකතු වන ලෙස මහජනයාට දන්වූ කල්හි නිසැකවම ඔබේ පැත්තට අත්වන ඉරණම ශූන්‍ය වේ. එනම් කිසිවකු නැත යන්නයි. සියල්ලෝම අද්මිරාල්වරයාට එකතුවනු ඇත.

සමාජ අසම්මත නිර්මාණ ජාත්‍යන්තරයට බෙද හරින කලාකරුවා ගැන සමාජය අවධියෙන් සිටිය යුතුය. අධිරාජ්‍යවාදී බලල් හස්ත මගින් අපේ සමහර කලාකරුවන් ඩැහැ ගැනීමට සැරසෙන බව දන් දන් වැටහේ. විශාල වශයෙන් මුදල් සූදානය කොට ශ්‍රී ලංකාවේ සංස්කෘතියට ආගමට හා වර්ගයාට නිගා දෙන නිර්මාණ සාදවා තම රටවල රැගෙන ගොස් ප්‍රදර්ශනය කර තමන් වැය කළ මුදලට මෙන් දහගුණයක් ලාභ ලබන කුට ජාත්‍යන්තර ව්‍යාපාරිකයන් අපේ කලාකරුවන් අතකොලු බවට පත් කර ගෙන ඇත. මුදල් ඇති ඕනෑම පුද්ගලයකුට සිනමාපටයක් කුමන හෝ කතා තේමාවක් යටතේ නිර්මාණය කළ හැක. එලෙසම ජාත්‍යන්තර තරග සඳහා ද ඉදිරිපත් කළ හැක. එහෙත් රටේ සංස්කෘතියට හෝ ආගමට නිගාදෙන ආකාරයේ නිර්මාණ ජාත්‍යන්තර තලයට මුදහැරීමට පෙර සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශය හරහා නිසි තෝරා ගැනීමකින් පසු එලෙස ජාත්‍යන්තරයට මුද හැරීම උචිත යැයි ප්‍රකාශ කරමි. එසේ කිරීමෙන් මෙවැනි සංවාද ඇති නොවෙනු ඇත.

මතභේදයට තුඩු දී ඇති නිර්මාණකරුවන් ආරක්ෂා කරමින් එම නිර්මාණවල කිසිදු වරදක් නොමැති බව සමාජයට පෙන්වීමට උත්සාහ දරන අබේසේකරයන් වැනි සිනමාකරුවන් මහජනතාව දකිනුයේ මහා කකුලුවෙකු ලෙසය. එම නිසා පොඩි කකුලුවන්ට දෙස් පවරා පලක් නොමැත. පොඩි එවුන් යන්නේද මහ කකුලුවා යන පාරේම ඇදවය. දිවා රාත්‍රී මුහුදෙ රාජකාරී කළ මා ඇතුළු අද්මිරාල්වරයා ද මහ මුහුද ගැනත්, එහි ගැඹුරත් මුහුදු ජීවිත ගැනත් අබේසේකරයන්ට වඩා හොඳින් දන්නෙමු. එම නිසා අපට කකුලුවන් අනුභව කිරීමට අවශ්‍ය වූ විට කිසිම දිනක පොඩි කකුලුවන් ගන්නෙ නැත. හොඳට රස කර කෑමට නම් ගන්නේ අඩු පඩු විශාල මහ කකුලුවන්ය. එබැවින් රස කර කර මහා සිනමා කකුලුවාට මෙසේ දෙසමි. (අනුභව කරමි)

පොත පත පරිශීලනය කිරීමෙන් හා ලෝක සම්මත විභාග හා පරීක්ෂණ සමත්වීමෙන් ලත් ප්‍රතිඵල සැලකිල්ලට ගෙන යමෙකුගේ උගත්කම මැන බැලිය හැක. එහෙත් බුද්ධිය එසේ නොවන්නේය. කෙතරම් උගතෙකු වුවත් නිසි තැනට නිසි වෙලාවට නිසි ආකාරයට නොහසුරුවන බුද්ධිය පරාජිත භාවය පෙන්නුම් කරයි. රණසිංහ ප්‍රේමදාස නම් මිනිසා පූර්ණ උගතෙකු නොවීය. එහෙත් ඔහු බුද්ධිමත් පුද්ගලයෙකි. එහි ප්‍රතිඵලය වූයේ බුද්ධිය මෙහෙයවූ සාමාන්‍ය මිනිසා තම රටේ ජනාධිපති ධුරය දක්වා පැමිණීමය. අබේසේකරයාණෙනි, ඔබගෙ බුද්ධි මට්ටම අනුව ප්‍රකාශ කරන ලද කරුණු කාරණා අනුව, ගොඩබිම් සුවසේ ඉන්න සත්ත්වයන් දක තමාට ද එසේ කළ හැකි යැයි සිතා ගොඩබිමට එන මෝඩ මාලුවෝ නම් මා දක නැත. එහෙත් සිත පාලනය කර ගත නොහැකිව සිය දිවි නසා ගැනීම සඳහා මහ මුහුදට පනින මනු සත්තුනම් දක ඇත. මුහුදට පනින එවැනි මනු සත්තු සම්හර අවස්ථාවලදී බේරා ගන්නට ඉදිරිපත් වන්නේ ද අද්මිරාල් වීරසේකර සමඟ නාවික හමුදාවේ සිටින නාවිකයෝය. ඔබ අද්මිරාල්වරයා මුහුදේ මාලුවකුට සමාන කර ඇත. ඔබේ බුද්ධිය තරම එයින් ම විනිවිද දකිමි. හමුදාවේ අද්මිරාල්කම ඔහුගේ වෘත්තියයි. ඒ හැර ඔහුද ඔබ අප මෙන් දෛනික ජීවිතයේ සමාජයේ ජීවත්වෙමින් තම සුහදයින් සමඟ එක්ව ජීවත්වන්නෙකි. ඔහුගේ ස්ථිර වාසය මහ මුහුද නොවන බව දන්වමි. එම නිසා මුහුදු ජලය පතිත වී මල බැඳීමට තරම් හිතක් ඔහුට නොමැත. එබැවින් විහිළුවට මෙන් තවත් එක් කරුණක් ඔබගෙන් ඇසීමට කැමැත්තෙමි. තිස්ස අබේසේකර නම් සිනමාකරුවාට, රෝගියකු පරීක්ෂා නොකර 'ඇල්සයිමර්ගෙ ව්‍යාධිය' නමැති රෝගය යමෙකුට වැලඳී ඇතැයි නිගමනයකට පැමිණීමට හැකි පරිදි පශ්චාත් වෛද්‍ය උපාධි සහතිකයක් නිකුත් කළ වෛද්‍ය විද්‍යාලය කුමක්දැයි දැන ගැනීමට ශ්‍රී ලංකාවාසී සියලු රසික ජනතාව කැමැත්තෙන් ඇති බව සහතික කරමි.

ත්‍රස්තවාදීන් විසින් ත්‍රිකුණාමලයේ බුදු පිළිමය ඉවත් කරන ලෙස උද්ඝෝෂණය කළ අවස්ථාවේදී තම ආගම ධර්මය බේරා ගැනීම උදෙසා එම බුදු පිළිමය ආරක්ෂා කර ගැනීම සඳහා හමුද බල ඇණි යොද අද්මිරාල් වීරසේකර මුළු රටේම ජනතාවගේ ගරු බුහුමනට පත් විය. ඔහුට එසේ ජනතා ප්‍රසාදය ලැබුණේ ඔබ පවසන පරිදි 'ඇල්සයිමර්ගෙ ව්‍යාධිය' රෝගයෙන් පෙළුණු නිසා දැයි අසමි.

තවද ශ්‍රී ලංකා නාවික හමුදාවේ රියර් අද්මිරාල් තනතුර සඳහා පත්වන්නේ ඊට පහළ නිල තරාතිරම් රාශියක් පසු කොට ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ හා සේවා පලපුරුද්ද අනුව වන අතර නිලයෙන් නිලය උසස්වීමේදී ඒ සෑම අවස්ථාවේදීම සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වීමෙන් අනතුරුවය. ඔබගේ මතයට අනුව අද්මිරාල්වරයාගේ වෛද්‍ය පරීක්ෂණ සිදු කළ රජයේ සියලු ම වෛද්‍යවරු ද 'ඇල්සයිමර්ගෙ ව්‍යාධිය' රෝගයෙන් පෙළන අය විය යුතුය. ඔබ විසින් නිර්මාණය කරන ලද සිනමා කෘතියක සැලෝලයිඩ් පටිය වැරදීමකින් ආපස්සට කැරකුනත් තම නොකොටටම පෙරලා වෙඩි තැබීම සඳහා අණ දීමට තරම් අඩු මානසිකත්වයක් අද්මිරාල්-වරයාට තබා කිසිම හමුද භටයකුට නොමැති බව ඔබ වටහා ගත යුතුව ඇත.

මහා සිනමාකරුවාණෙනි තම රටේ උත්තරීතර හමුදාවට හෝ හමුදාභටයකුට අවලාද අවමාන කිරීම ජාතික ද්‍රෝහි ක්‍රියාවකි. එමෙන්ම හමුද සෙබළ චරිතය හා ඔවුන්ගෙ සාමාජිකයන්ගේ ආත්මය විකුණාගෙන කෑම ද දේශද්‍රෝහි ක්‍රියාවකි. ඔබ එද රඟ පෑ වීර බුද්ධපුත්‍ර (හාමුදුරුවන්ගෙ) චරිතය සැලෝලයිඩ් පටියකට සීමා වී ඇතත් අද්මිරාල්වරයාගේ රංගනය සජීවි රංගනයක් බව ඔබට නොවැටහෙන්නේ මන්ද යැයි පුදුමයකි. ඒ හෙයින් ඔබට මෙසේ දන්වමි. ළමයකු වරදක් කළ විට පියා විසින් ළමයාගේ පැත්ත ගෙන එය නිදොස් කිරීමේදී, සමාජය ඔහු නියම පියෙකු ලෙස පිළි නොගනී. එහෙත් ළමයා තම පියා වීරයකු ලෙස පිළිගනී. එබැවින් ඔබේ සිනමා ලඳරු අනුගාමිකයකු අතින් ද අප සමාජයට යම් වරදක් වී ඇති බව නැගෙන චෝදනා අනුව පිළිගත යුතුය. නියම කලාකරුවකු ලෙස නිහතමානීව එම වරද පිළිගැනීමට තරම් නම්‍යශීලී වන ලෙස ජාතියේ නාමයෙන් ඔබගෙන් ඉල්ලා සිටිමි. තවද අප රටේ රසිකයා හැම අවස්ථාවකදීම බලාපොරොත්තු වන්නේ ඕනෑම නිර්මාණයක් තුළින් තම හදවතට හා මනසට නැවුම් ආස්වාදයක් ගෙන එන සොඳුරු සුළඟකටය. එය පිරිසිදු සුළඟක් විය යුතුය. එසේ නොමැතිව නිර්මාණයක් තුළින් සමස්ත සමාජයම ගඳ ගස්වන, විෂබීජ සහිත, දුගඳ හමන අපිරිසිදු සුළඟක් කිසිම රසිකයෙක් නොපතනු ඇත. එම නිසා සිනමාකරණය තුළින් අප රටේ සමාජයට අහිතකර, සමාජය ප්‍රකෝපකාරී කරවන සුළු නිර්මාණ ලක් දෙරණට යළි කිසිම දිනයක නොයෙන ලෙසත් විෂ සුළඟ (නො) එනු පිණිස සිනමාකරුවන් වශයෙන් වග බලා ගන්නා මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමි. අබේසේකර මහතාණෙනි, අමනාප නොවන්න, තවමත් මාගේ සිනමා ලෝකයේ අපරාජිත මහා සිනමාකරුවා ඔබ වන්නේය. එහිද වචන දෙකක් නැත.

මෙය ජාතිය මුහුණ දෙන බේදවාචකය පිළිබඳ ඉගියකි

තිස්ස අබේසේකරට පිළිතුරක්

රුසියන් නවකථාව, ඇමරිකන් නවකථාව, ජෝර්ස් ස්ටයිනර් ලූකාක්ස් ආදී වූ කී නොකී විශ්ව සාහිත්‍ය පදනයයන පෝෂණය වී ඇති තිස්ස අබේසේකර මහතා ඒ අසීමිත සාහිත්‍ය ඥානයත්, නවකථා විචාරකයා සතුව තිබිය යුතු සංස්කෘතික විඥානයක් සිය ලිපියෙන් අප හමුවෙහි ප්‍රදර්ශනයකර තිබේ. ඒ මහතාට අනුව සයිමන් නවගත්තේගම "අති විශිෂ්ට" නවකතාකරුවෙකි. එපමණක් නොවේ. "විරාගයෙන්" ඇන හිට ඇති සිංහල නවකතාව ඉදිරියට ගෙන ගොස් ඇත්තේ නවගත්තේගමගේ අති විශිෂ්ට නවකතා මගින් බවද ඔහු බී. බී. සී. සිංහල සංදේශයෙන් පවසා ඇත. ඔහුගේ මේ ප්‍රකාශය හමුවෙහි ඔහු සමග වාද කිරීම නිරර්ථක බව කිව මනා නොවේ. එහෙත් ඒ ප්‍රකාශය, සාහිත්‍ය ඉක්මවා සිටින, අප අද මුහුණ දෙන ජාතික බේදවාචකය පිළිබඳව ප්‍රබල ඉගියක් සපයන්නක් ලෙස මම දකිමි.

අපේ රට ජාතිය, එක් අතකින් නොව සෑම අතකින් විනාශ මුඛය වෙත ළං වෙමින් පවතින බව මා කලක් වේලේ සිට පවසා සිටින්නේ කුමක් නිසාද යන්න හෙළි කරන්නක් නොවේද මේ ප්‍රකාශය. මෙවැනි ප්‍රකාශද රටක වසන බුද්ධිමතුන්, සාහිත්‍යකරුවන් වලමත් වූ අද බාල පිරිසක් බවට පත්වීම ඒ විනාශයේ ආරම්භය සනිටුහන් කරතියි යන මතයට මීට වැඩි හොඳ උදාහරණයක් තිබිය හැකිද?

ගුණදාස අමරසේකර